**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ මහා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 1.2.2 ඡේදයේ (ඇ), (ඉ),(ඊ),(උ),(ඌ),(එ),(ඒ),(ඕ),(ච) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | සභාවේ අදහස් දැක්වීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු 2020 වර්ෂයට පෙර පැවති ඉඩම් ගොඩනැගිලි, මංමාවත්, බෝක්කු හා පාලම් වටිනාකම හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි. | මේ පිළිබඳව පරීක්ෂාකර බලා නිවැරදි ගිණුම්ගත කිරීමට අදාළ නිලධාරින්ට උපදෙස් ලබා දී ඇත. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සභාව සතුව ඉඩම් ඔප්පු නොමැති සහ ඉඩමේ වටිනාකම නොමැති ඉඩම් 15 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි. | ඔප්පු නොමැති හා ඉඩමේ වටිනාකම් නොමැති ඉඩම් හඳුනාගෙන ගිණුම් ගත කිරීමට ඉදිරියේදි කටයුතු කරනු ලබයි. | එම |
| (ඇ) | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 16 දේපළ, පිරියත හා උපකරණ යටතේ කෙරීගෙන යන වැඩ ලෙස ගොඩනැගිලි වටිනාකම රු.19,872,678 ක් සහ පාරවල් හා බෝක්කු රු.12,949,006 ක් දක්වා තිබුණද, සභාවේ නාගරික ඉංජිනේරුවරයාගේ සහතික කිරීම අනුව 2021 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ නොමැති බව නිරීක්ෂණය විය. | කෙරීගෙන යන වැඩ කටයුතු යටතේ දක්වා ඇති මුදල වූ රු.19,872,678.00 ක මුදල සටහන් අංක 16 යටතේ ප්‍රමාද දෝෂයකින් සටහන් වී ඇති අතර එය වැඩ සම්පූර්ණ කර නිම කිරීම් ලෙස සටහන් කර නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | එම |
| (ඈ) | සභාව සතු නිල නිවාසයන් වෙත ලබා දී ඇති ලී බඩු හා උපකරණ නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි. | සභාව සතු සියලු නිල නිවාස වල ලී බඩු හා උපකරණ ඇතුලු අනෙකුත් දෑ වෙන වෙනම ඉන්වෙන්ට්‍රිගත කරන ලෙස අදාළ නිලධාරින්ට උපදෙස් ලබා දී ඇත. 2022 වසරේදි එය ගිණුම් ගත කිරීමට නියමිතය. | එම |
| (ඉ) | ජනජය සිටි ව්‍යාපෘතිය වෙනුවෙන් නවලෝක කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත ගෙවිය යුතු රු.1,488,509ක්, ප්‍රමාද ගාස්තු රු.29,631,518ක් සහ අතරුදවුම් මුදල් | ජ නල් සටහන් යටතේ 2022 වසරට යොදා නිවැරදි කරන ලදි. | එම |

| | | | |
|---|---|---|---|
| | රු.84,399,312ක් වශයෙන් එකතුව රු.115,519,339ක් 2021 දෙසැම්බර් 31 දිනට ණයහිමියන් ලෙස ගිණුම්ගතකර නොතිබුණි. | | |
| (ඊ) | 2020 වර්ෂයේදී ලද ප්‍රාග්ධන ස්කන්ධ ප්‍රදානය වන රු.31,339,815න් 2021 වර්ෂය සඳහා ක්‍රමක්ෂය කළ යුතු වටිනාකම වන රු.3,133,982 ක් අඩු කළ පසු ඉතිරි ශේෂය වන රු.28,205,833 සහ 2021 දී ලද ප්‍රාග්ධන ප්‍රදානය වන රු.39,257,979 හි එකතුව වන රු.67,463,812 ක් වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ ස්කන්ධය යටතේ හඳුනා නොගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලෙස සටහන් කළ යුතු වුවද එය රු.63,100,671 ක් ලෙස එනම් ශුද්ධ ස්කන්ධය රු.4,363,141 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම අඩුපාඩුවද ඉහත ක යටතේ වූ අඩුපාඩුව සමග 2022 වසරේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට සටහන් කර ගෙන ඇත. | එම |
| (උ) | 2019 හා 2020 වර්ෂවල මිලදී ගෙන ඇති ජල කර්මාන්තවලට සම්බන්ධ (W/W/A/01/01) රු.561,772 ක් වටිනා අයිතමයන් 19ක් ගබඩා ලෙජර් අනුව අදාළ ව්‍යාපෘතිය සඳහා නිකුත් නොකර තොගයෙහි පැවතියත් සමාලෝචිත වර්ෂ අවසාන ජල කර්මාන්ත තොගයට ඇතුළත් කර නොතිබුණි. එම වටිනාකමෙන් තොගය අඩුවෙන් දැක්වුණි. | එම මුදල් මිලදී ගැනීම් සිදු කර ඇත්තේ මොරගස්මුල්ල නිවාස සංකීර්ණය ඉදි කිරීම සඳහා වන අතර එය ඉදි කිරීම් කටයුතු අවසන් නොමැති නිසා මෙම භාණ්ඩ ඉතිරි වී පවතී. | එම |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 04 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා උපලේඛන අනුව වටිනාකම අතර රු. 33,998,683ක වෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | ලේඛන හා උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.1,641,883ක හඳුනා නොගත් සේවක ණය ශේෂ ගිණුමට මාරු කිරීමට අදාළ විස්තරාත්මක උප ලේඛනය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ලේඛන පරීක්ෂා කරමින් පවතී. | අදාල උපලේඛන ඉදිරිපත් කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ අයභාරය රු.161,796,825ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ අයභාරය රු.102,549,081ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රතිඵලය රු.59,247,744කින් වර්ධනය වී තිබුණි.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකු ජංගම ගිණුමක දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව බැංකු ගාස්තු හා සෘජු බැංකු හර එකතුව රු.140,047 ක් පැවති අතර එම ශේෂයන් නිශ්චිතව හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි. | බැංකු ගාස්තු හා සෘජු බැංකු හර උපලේඛණයේ දක්වා ඇති ගණුදෙනු වලට අදාළ පාර්ශව මේ වනවිට හඳුනාගෙන ඇති අතර ඔවුන්ට වැඩිපුර සිදු කරන ලද ගෙවීම් නැවත අප සභාවට අය කර ගනිමින් පවතී | වැඩිපුර සිදුකරන ලද ගෙවීම් නැවත අයකර ගැනීමට නොපමාව කටයුතු කළයුතු වේ. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **වරිපනම් බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට අයවිය යුතු වරිපනම් බදු ශේෂය රු.136,885,146 ක් වූ අතර එයින් වාර්ෂික වරිපනම් බදු වටිනාකම රු.50,000 ක් ඉක්ම වූ නිවාස, හිස් ඉඩම් හා ව්‍යාපාර ස්ථාන 295 කින් රු.40,817,645ක් අයවිය යුතුව තිබුණි. මෙම වරිපනම් බදු 2022 ජුනි දක්වා අයකරගෙන නොතිබුණි. | සමාලෝචිත වර්ෂය අවසාන වන දිනට අයවිය යුතු වරිපනම් බදු ශේෂය තුළ ඇතුළත් වාර්ෂික වරිපනම් බදු වටිනාකම රු.50,000 ඉක්මවූ නිවාස හිස් ඉඩම් හා ව්‍යාපාර වලින් ඒකක 44 කින් රු.4,893,000 ක් දැනට අය කරගෙන ඇති අතර ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා අවසාන නිවේදන යවා ඇති අතර ඉදිරියේදී ජංගම සේවා හා දේපළ තහනම් කිරීමේ කටයුතු මගින් වරිපනම් බදු හිඟ අය කරගැනීම සැලසුම් කර ඇත.තවද පසුගිය කාලය තුළ පැවති කොරෝනා උවදුර හේතුවෙන් හා ඉන්ධන අර්බුදය හේතුවෙන් සැලසුම් කර තිබූ ජංගම සේවා කටයුතු හා දේපළ තහනම් කටයුතු කල් දැමීමට සිදු විය. | හිඟහිටි වරිපනම් ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

(ආ) **කඩ කුලී**

-----------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු මුළු කඩකුලී ආදායම රු.31,866,491 ක් විය. | හිඟ කඩ කුලී අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | එම |

(ඇ) **නිල නිවාස කුලී**

------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂ අවසානයට අයවිය යුතු නිල නිවාස කුලී වටිනාකම රු.84,843 ක් වූ අතර, ඒ තුළ පවතින අවුරුදු 5 ත් 10 ත් අතර කාලයක සිට අයවිය යුතු රු.79,430 ක් පැවතුණි. | හිඟ ශේෂ කපා හැරීම සඳහා නිර්දේශ ඉල්ලුම් කර 2015.12.28, 2018.09.30, 2019.12.07 දිනැතිව පළත් පාලන කොමසාරිස් (බ.ප.) පිටපතක් සහිතව සහකාර පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමුකර ඇත. | එම |

(ඈ) **විනෝද බදු**

--------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂ අවසානයට සිනමා ශාලා දෙකකින් අයවිය යුතු විනෝද බදු ශේෂය රු.3,169,717 ක් වන අතර ඒ තුළ පවතින අවුරුදු 5 ත් 10 අතර කාලයක සිට අයවිය යුතු රු.2,781,680 ක් 2021 දෙසැම්බර් 31 දින වනවිටද අයකරගෙන නොතිබුණි. | 2015 හා 2016 වර්ෂවල බිල් කල ආදායම රු.2,781,679.16 අය කරගත නොහැකි විය. | එම |

(ඉ) **කසළ බැහැර කිරීමේ ගාස්තු**

----------------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට සභා බලප්‍රදේශයේ ව්‍යාපාරික ස්ථානවලින් අයවිය යුතු කසල බදු ශේෂය රු.4,097,526 ක් වන අතර ඒ තුළ අවුරුදු 1 හා 3 අතර කාලයක සිට අයවිය යුතු රු.1,267,376ක් 2021 දෙසැම්බර් 31 දිනවන විටද හිඟව පැවතුණි. | හිඟ ගාස්තු අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | එම |

(ඊ) **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---------------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ මුද්දර ගාස්තු රු.226,101,938 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී අයවිය යුතු මුද්දර ගාස්තුව රු.323,378,363ක් විය. තවද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට උසාවි දඩ රු.3,891,501ක් අයවිය යුතුව පැවති අතර එම | මෙම උසාවි දඩ මුදල් අය කර ගැනීමේ කටයුතු කරගෙන යාමට නොහැකි විය. | එම |

ශේෂය වර්ෂ 5 සිට 10 දක්වා කාලයට අදාළ රු.879,787 කින් සහ වර්ෂ 10 ට වැඩි කාලයක සිට අයවිය යුතු රු.3,011,713කින් සමන්විත විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 පෙබරවාරි 16 දින රු.619,276,616 ක කොන්ත්‍රාත් වටිනාකමට පිටකෝට්ටේ ජයරජසිටි මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු සමඟ ගිවිසුම්ගත වී තිබුණි. ඒ සඳහා උපදේශක ගාස්තු ලෙස රු.2,638,191 ක් හා ඉදිකිරීම් සඳහා රු.255,707,477 ක් වැයකර තිබූ අතර 2018 සැප්තැම්බර් 10 දින කොන්ත්‍රාත්කරු වැඩබිම අත්හැර දමා තිබුණි. | ජයරජ සිටි මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය 2016 වර්ෂයේ ආරම්භ කරන ලද්දේ පෙර විකුණුම් ක්‍රමය මත අරමුදල් සම්පාදනය කර ගැනීම මගින් වන අතර එසේ පෙර විකුණුම් ක්‍රමය මගින් ලබා ගත හැකි වූයේ 30% ක පමණ මුදල් ප්‍රමාණයක් වන අතර ඒ වන විට ව්‍යාපෘතියේ ඉදිකිරීම් ඔරියන්ට් කොන්ත්‍රාත් සමාගම මගින් සිදු කරමින් තිබුණි.එහි ඉදිකිරීම්හි ඇති වූ දෝෂයක් හේතුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් වාර්තාවක් කැඳවූ අතර එම ආයතනය ඉදිරි ඉදිකිරීම් සඳහා උපදෙස් ලබා දී තිබුණද සභාව විසුරුවා හැර 2017 වර්ෂයේ දී ව්‍යාපෘතිය කරගෙන යාමට මුදල් නොමැති නිසා නාගරික කොමසාරිස් විසින් ව්‍යාපෘතිය නතර කරන ලදි. මුදල් කමිටුව විසින් නාගරික ඉංජිනේරුවරයා විසින් සංශෝධිත ව්‍යුහාත්මක සැලැස්ම අනුව නැවත මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා යෝජනාවක් මුදල් කාරක සභාව වෙත ඉදිරිපත් කළ අතර රටේ පවතින ආර්ථික තත්ත්වය අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම තාවකාලිකව නතර වී ඇත. | ව්‍යාපෘති කඩිනමින් සම්පූර්ණ කර සැලසුම් නියමිත පරිදි ක්‍රියාත්මක කළ යුතුවේ. |
| (ආ) | නව නගර සභා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ව්‍යාපෘතියේ ගෘහ නිර්මාණ කටයුතු වෙනුවෙන් උපදේශන සේවා සැපයීම සඳහා 2015 ජනවාරි 26 දින රු.36,010,657 කට ගිවිසුම්ගත වී තිබුණු අතර උපදේශක ගාස්තු වෙනුවෙන් | මෙම නගර සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධව 2013.03.28 දින එවකට සිටි ගරු නගරාධිපතිතුමාගේ යෝජනාවක් අනුව වැලිකඩ පොලිසිය අසල ඉඩමේ ඉදිකිරීමට යෝජනා විය.2013.06.28 දින මහා සභා තීරණ අංක 06.01 යටතේ ඉහත ඉඩම් මහ සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා | ඉඩමේ අයිතිය පවරාගෙන ව්‍යාපෘති කඩිනමින් සම්පූර්ණ කර සැලසුම් නියමිත පරිදි ක්‍රියාත්මක කළ යුතුවේ. |

| | |
|---|---|
| රු.26,220,340 ක් ගෙවා තිබුණි. පසුව ඉඩමේ අයිතිය සභාව සතු නොවන බැවින් නව නගර සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සභාව විසින් අතහැර දමා තිබුණි. අයවිය යුතු ඉතිරි මුදල් අයකර ගැනීමට උපදේශක සමාගම විසින් සභාවට එරෙහිව නඩුවක් පවරා ඇති අතර ඒ සඳහා සභාව විසින් රු.877,887ක්ද වැයකර තිබුණි. තවද මෙම හිඟ මුදල් නොගෙවීම නිසා ඊට අදාල ප්‍රමාද ගාස්තු රු.11,468,913ක්ද අයවිය යුතුව පැවතුණි. | ඉංජිනේරු උපදේශකවරු හා ගෘහ නිර්මාණ ශිල්පින් බඳවා ගැනිමට අනුමැතිය ලැබී ඇති අතර 2013.07.29 මහ සභා තීරණ අංක 06.01 යටතේ සභාව මගින් ව්‍යාපාතිය සඳහා සැලසුම් සකස් කිරීමට වරලත් ගෘහ නිර්මාණ ශිල්පීන් ලියාපදිංචි කිරීමට සභාව විසින් අනුමත කරන ලදි. එම සභා තීරණ අනුව ටෙන්ඩර් කැඳවා ඇගයීම් කිරිම වාර්තාව අනුව 2014.01.31 දින මහා සභා අනුමැතිය පරිදි රංජන් නඩේෂ්පිල්ලේ ඇසෝසියේට්ස් ආයතනය තෝරා ගෙන ඇත. ඒ අනුව ඉඩමේ අයිතිය සභාව සතු නොවන බැවින් අදාළ ඉදිකිරීම් සභාව විසින් අතහැර දමා තිබුණි යන්න බැහැර කරනු ලැබේ. |

**3.2** **හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාහන අනතුරු 3ක් සම්බන්ධයෙන් අළුත්වැඩියා වියදම රු.127,700 ක් රක්ෂණයෙන් ආවරණය කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | රක්ෂණ වන්දි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | නාවල සුසාන භූමිය හා අවමංගල්‍ය ශාලාව (පාලර්) ඉදිකරන භූමිය වටා දැනට පවතින අනාරක්ෂිත තාප්පය ඉවත්කර නව ආරක්ෂිත තාප්පයේ කොටසක් ඉදිකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරුණි. | | |
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (ආ) ප්‍රකාරව සියළුම ආශ්‍රිත වියදම් ඇතුළු පිරිවැය ඇස්තමේන්තුවක් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කළ යුතු වුවත් ආරම්භයේදී සකස් කරන ලද මුළු පිරිවැය ඇස්තමේන්තු මුදල වූ රු.3,813,645 ක් තුළ සුසාන භූමියට පිවිසීමේ ගේට්ටුව, | මුල් අවස්ථාවේදි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ලබා දුන් ප්‍රතිපාදන වලට අදාළව පමණක් ඇස්තමේන්තු සකස් කර ඇත. | අදාල ව්‍යාපෘතිවල කටයුතු විනිවිද භාවයෙන් සිදුකළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | ආරක්ෂිත කුටිය සැකසීමේ, සොහොන්කොත් ඉවත්කොට නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේ හා මාර්ග සංවර්ධන අධිකාරියට දෙනු ලබන නව භූමි ප්‍රමාණය සකස් කිරීම ආදී වියදම් ඇතුළත් කර නොතිබුණි. | | |
| (ආ) | ඉහත (අ) ඡේදයේ දක්වා තිබූ වියදම් ඇතුලත් කිරීමෙන් පසුව නැවත ඇස්තමේන්තුවක් සකස් කර තිබූ අතර එම වියදම් ඇස්තමේන්තුව රු.5,372,345 ක් වුවත් අනුමත ප්‍රතිපාදන රු.3,000,000 ක් නිසා ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් අවශ්‍ය ඉතිරි වියදම් සඳහා ප්‍රතිපාදන සපයා ගන්නා ආකාරය පිළිබඳ තීරණයක් ගෙන නොතිබුණි. තවද ඒ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කර නොතිබුණි. 2021 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ මෙම ව්‍යාපෘතිය සඳහා රු.3,000,000 ක මුදලක් අනුමත වී තිබීම හේතුවෙන් එම මුදලට සරිලන පරිදි ඇස්තමේන්තු සකස් කර තිබුණ ද එහි මුළු පිරිවැය ඇස්තමේන්තු මුදල අනුමත පිරිවැය ඇස්තමේන්තුව ඉක්මවා ගොස් තිබුණි. | මුළු වියදම් ඇස්තමේන්තුව (VAT සහිත) රු. 5,372,345.00ක් වූ අතර ඉන් කොටස් ලෙස අදාල විමධ්‍යගත අධාර යටතේ තාප්පය ඉදිකිරීම කර්මාන්ත අදියර i,ii හා iiiවශයෙන් සිදු කෙරිණි<br>නාවල බටහිර වසමේ (220 බී) නවල සුසාන භූමිය හා අවමංගල්‍ය ශාලාව (පාලර්) ඉදිකරන භූමිය වටා දැනට පවතින අනාරක්ෂිත තාප්පය ඉවත් කර නව ආරක්ෂිත තාප්පයේ කොටසක් ඉදිකිරීම සඳහා 2021 විමධ්‍යගත ප්‍රතිපාදනයෙන් රු. 3,000.000 ක ප්‍රතිපාදන වෙන් විය. | අදාළ ඇස්තමේන්තුගත ප්‍රතිපාදන තුළ කර්තව්‍යයන් ඉටුකර ගතයුතු වේ. |
| (ඇ) | මාර්ග සංවර්ධන අධිකාරිය මගින් දැනට පවතින කළුගල් තාප්පයේ සිට මීටර් 1.6 ක් පිටුපසට ගත යුතු බවට සලකුණු කර ඇති බවත් එම කොටස වාහන නැවතුම් අංගනයක් සඳහා උපයෝගී කරගෙන මුදල් අයකර ගැනීමට හැකි බවත් ඉංජිනේරුවරයා විසින් ලිඛිතව දක්වා තිබුණි.ඒ අනුව මීටර් 1.6 ක් පිටුපසට ගැනීම වෙනුවට අඩි 15 ක් ආපස්සට ගෙන තාප්පය ඉදිකිරීම සිදුකරමින් පවතින බව 2021 නොවැම්බර් 3 දින විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මේ සඳහා 1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ 11 වෙන පරිච්ඡේදයේ 5(1) ප්‍රකාරව සුසාන භූමි ප්‍රමාණය අඩුකිරීම් හෝ වෙනත් අයුරකින් වෙනස් කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය තවමත් වැඩ අවසන් නොමැති ක්‍රියාකාරි තත්ත්වයේ පවතින ව්‍යාපෘතියක් බැවින් මෙම සියලු නිරීක්ෂනයන්ට අනුගත වන පරිදි ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සැලසුම් කරනු ලැබේ | විධිමත් පරිදි අවශ්‍ය අනුමැතින් හා එකඟතාවයන් සහිතව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | පවතින තාප්පයේ සිට ඉදිවන නව තාප්පය අඩි 15ක් පිටුපසට ගැනීමෙන් එනම් මාර්ග සංවර්ධන අධිකාරියට ලබා දෙන භූමි ප්‍රමාණයෙන් ඉදිරියේදී ලබා ගන්නා ප්‍රයෝජනය සම්බන්ධයෙන් පැහැදිලි එකඟතාවයක් නොතිබූ අතර එම භූමි ප්‍රමාණය සකස් කර ගැනීම සඳහා කිසිදු සැලැස්මක් ඇස්තමේන්තුවේ නොතිබුණි. ඒ සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය සමග ද කිසිදු එකගතාවයකට පැමිණ නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | එම |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2015 වර්ෂයේ දී රු.2,825,375 ක් වැයකර මුද්‍රණය කරන ලද අසිරිමත් කෝට්ටේ නැමති ග්‍රන්ථයේ පිටපත් 4000 කින් 3891 ක් ගබඩාවට ලැබී තිබුණු අතර 2021 වර්ෂය අවසාන වන විට පිටපත් 178ක් හා රු.155,750ක් වටිනා එම පොත් ආවරණ කවර 192ක් ගබඩාවේ නිෂ්ක්‍රියව පැවතුණි. | ගබඩාවේ ඉතිරි වී ඇති අසිරිමත් කෝට්ටේ ග්‍රන්ථ ශිෂ්‍ය ශිෂ්‍යයන් ගේ නැණ පහස වැඩි දියුණු කිරීමට රජයේ පාසල් හා රජයේ පුස්තකාල සඳහා ලබා දීමට සුදුසු වැඩ පිළිවෙළක් සකස් කරමින් පවති. | සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගතයුතු වේ. |

### 3.5 වත්කම් කළමනාකරණය

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| | **සභාවට අයිති පොදු ළිඳ නැමති දේපළ නැවත මිලදී ගැනීම** | | |
| (අ) | මහා නගර සභාව සතු ස්ටැන්ලි තිලකරත්න මාවතේ අංක 285/බී දරන පර්චස් 01.75 ක පොදු ළිඳ නමැති දේපල නැවත මිලදී ගැනීමේ ගනුදෙනුව සඳහා සභාවේ නිලධාරීන් සහභාගි වී ඇති බව නිරීක්ෂණය වූ අතර සභා දේපල 2019 ජූනි 24 දින රු.1,575,000කට බාහිර පාර්ශවයකට විකුණා එම පාර්ශවයට අයිතිය ප්‍රකාශ කිරීමට ඉඩ සලසා තිබුණි. | මෙම ප්‍රශ්නගත දේපළ 1979 වර්ෂයේ සිට මහානගර සභාවට පූර්වගාමීන්ගෙන් ලැබුණු දේපලක් ලෙස තොරතුරු කැදවීමෙහි සඳහන් කර ඇතත් 1979ට පෙර වරිපනම් ලේඛන ගතව අදාල දේපළ ගැන සඳහනක් නැත. ඒ අනුව දේපළ පූර්වගාමීන්ගෙන් හෝ පවරාගැනීමක් මගින් සභාවට සතුවී ඇති බවට නිරීක්ෂණය නොවේ. අදාළ දේපළ අංක 2048 සහ 1979.06.10 දින | කඩිනමින් සුදුසු ක්‍රියාමාර්ග ගනිමින් සභාවට පාඩු සිදු නොවන සේ අවශ්‍ය කටයුතු සිදුකල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | දරණ පිඹුර අනුව පොදු ළිඳ සහ සුසානභූමිය ලෙස වෙන් කරන ලද සභාව සතු බිම් කොටසක් ලෙස රජයේ විගණනය විසින් සඳහන් කර ඇතත් සභාව සතු කිසිදු ලේඛනගත කරුණක් එකී දේපල සභාවේ උපලේඛන ගත සුසාන භූමියක් ලෙස හඳුනාගෙන හෝ ලේඛනගතව නැත. | |
| (ආ) | ඉහත සඳහන් ඉඩම සභාවේ 2016/2017 වර්ෂ සඳහා වන වරිපනම් ලේඛනයේ ස්ටැන්ලි තිලකරත්න මාවත, අංක 285 බී, පර්චස් 01.75ක ඉඩම් කොටස වරිපනම් ලේඛනයේ අංක 12 යටතේ කෝට්ටේ මහා නගර සභාවට අයත් ප්‍රසිද්ධ ළිඳක් ලෙස සටහන් කර තිබුණි. 2018/2019 වර්ෂයේ වරිපනම් ලේඛනයේ පාර්ශ්වකරුවන් 10 දෙනෙකුගේ නම් ලියා රතු පාටින් කපා ඉවත්කර තිබූ අතර 2020/2021 වරිපනම් ලේඛනයේ පොදු ළිඳ ලෙසද සටහන් කර ඇති බව නිරීක්ෂණය විය. | එසේ රතු පාටින් සඳහන් කරනුයේ පෙර අයිතිය හා නව අයිතිය පැහැදිලිව පෙන්නුම් කිරීම සඳහා වන අතර එය මෙම ආයතනයේ එදා සිට මේ දක්වා පවත්වාගෙන ගිය සාමාන්‍ය ක්‍රමවේදය වේ. ඒ අනුව ඉහත දේපලෙහි අයිතිය ඉදිරිපත් කරන ලද ඔප්පු සාරාංශයට අනුව නව අයිතිය ලේඛනගත කිරීමේදී පෙර තිබූ අයිතිය රතු පාටින් කපා ඉවත් කර පාර්ශවකරුවන් 10 දෙනාගේ නම් රතු පාටින් ලේඛනයට ඇතුලත් කර ඇත. | |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------

**මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ 2021 නොවැම්බර් 10 දිනැති අංක LGD/02/2021 දරන චක්‍රලේඛය අනුව 2021 මුදල් වර්ෂය සඳහා 2021 දෙසැම්බර් 31 දිනට අවසන් ගිණුම් සකස් කර ඊට අදාළ මූල්‍ය ප්‍රකාශන කට්ටලය 2022 පෙබරවාරි 28 දිනට පෙර පළාත් පාලන කොමසාරිස් හා පළාත් පාලන සහකාර කොමසාරිස්ටද පිටපත් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ 2021 මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2022 මැයි 24 දිනදීය. | 2022 වර්ෂයේ අවසන් ගිණුම නියමිත දිනට සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.අවසන් ගිණුමේ ආකාරය මෙම වසරේදි වෙනස් වීම හා ප්‍රධාන නාගරික ගණකාධිකාරිගේ ස්ථාන මාරු වීම හේතු විය. | අවසන් ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කළ යුතු වේ. |